# පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

හැඳින්වීම:

ජෛව විවිධත්වය යනු පෘථිවිය මත දක්නට ලැබෙන ජීව වස්තූන්ගේ (ශාක හා සතුන්) විවිධත්වයයි. එය 'භෞමික, සමුද්‍රික සහ අනෙකුත් පරිසර පද්ධතීන්, පාරිසරික සංකීර්ණ ඇතුළු සියළුම මූලාශ්‍රයන් අඩංගු, සහ ඒවායේ කොටසක් වන ජීව වස්තූන් අතර ඇති වෙනස් වීමේ හැකියාව, සහ ශාක හා සත්ව විශේෂයන් තුළ ඇති විවිධත්වය වේ'. ශ්‍රී ලංකාව ප්‍රමාණයෙන් කුඩා වුවද ඉතා අගනා ජෛව විවිධත්වයකට හිමිකම් කියන රටකි. විවිධ දේශගුණික තත්වයන් හා භූමි ලක්ෂණ නිසා ශ්‍රී ලංකාවේ පුළුල් පරිසර පද්ධති ව්‍යාප්තියක් දක්නට ලැබෙන අතර ජෛව විවිධත්වයද ඉහළ වේ. ලංකාවේ ජෛව විවිධත්වය උපරිම වශයෙන් දක්නට ලැබෙන එක් ස්ථානයක් ලෙස වනාන්තර හැඳින්විය හැක්කේ ලංකාවටම ආවේණික වූ දුර්ලභ ශාක හා සත්ත්ව විශේෂයන් මෙම වනාන්තරවල දැකිය හැකි බැවිණි.

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 14% ක පමණ භූමි ප්‍රමාණයක් සංරක්ෂිත භූමි ප්‍රදේශ ලෙස නීත්‍යානුකූලව මායිම් කර තිබුනද, වනහරණයට එරෙහිව වනාන්තර සංරක්ෂණයකර කළමනාකරණය කිරීම සඳහා ජාතික වනශේත්‍ර ප්‍රතිපත්තීන් හඳුන්වා දී තිබුනද, විවිධ හේතුන් නිසා පසුගිය දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ වනාන්තර පද්ධතිය ක්‍රමක්‍රමයෙන් අඩුවෙමින් පවතී. මෙලෙස සිදුවෙමින් පවතින වනහරණය රටේ ආර්ථික සහ සමාජීය සංවර්ධනයට මෙන්ම ස්වාභාවික පරිසර පද්ධති වලට සහ ජෛව විවිධත්වයටද දැඩි බලපෑමක් සිදුකර ඇත. එමනිසා තිරසාර සංවර්ධනයේ සහ සමාජ ආර්ථික සංවර්ධනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහාත්, ස්වාභාවික සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණය කර ගැනීම සඳහාත්, ජෛව විවිධත්වය රැකගැනීම සඳහාත්, මිනිසාගේ සුභසාධනය උදෙසාත් සොබාදහම විසින් පරිත්‍යාග කර ඇති පරිසර පද්ධතීන් ආරක්‍ෂා කරගැනීම ඉතා වැදගත්වේ.

වනපෙත් සහ පරිසර පද්ධතීන් ආරක්‍ෂා කිරීමේ සංකල්පය ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ සිට පැවත එන්නකි. පරිසර පද්ධතීන් ආරක්‍ෂා කරගැනීමේ වැදගත්කම, සහ අවශ්‍යතාවය මෙන්ම එහි වගකීමද සැලකිල්ලට ගෙන ඊට හේතු සාධක වන මූලික ගැටළු කිහිපයට විසඳුම් ලබාදීමට, සහ විනාශ වී අභියෝගයට ලක්වී ඇති ඉතා වැදගත් පරිසර පද්ධතීන් සංරක්ෂණය කර කළමනාකරණය කිරීමේ අරමුණින් රජය විසින් "පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය" ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුලින් බලාපොරොත්තු වන්නේ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ ප්‍රජාවට ප්‍රතිලාභ සැපයීම උදෙසා ප්‍රමුඛතා මත හඳුනාගත් පරිසර පද්ධතිවල කලමනාකරණය සහ ඒවායේ සේවාවන් වැඩිදියුණු කිරීමේ කර්තව්‍යන් සඳහා උරදීමයි. ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් පාරිසරික සහ ප්‍රජා ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය සැලසුම්කර තිබෙන අතර මතු පරපුර උදෙසා ජෛව විවිධත්වය සුපෝෂණය කිරීම සහ තිරසර පරිසර පද්ධති සේවාවක් සැපයීමද මේ තුලින් අපේක්ෂා කෙරේ. එම අපේක්‍ෂාව මුදුන්පත් කරගැනීම සඳහා ප්‍රමුඛතා පදනම මත හඳුනාගත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සිංහරාජ, නකල්ස්, කන්නෙලිය, හුරුළු, ගැටදිවුල, වන්නියාගම, වීරක්කොඩිචෝලේ, වවුනියාව, මාවිල්ලු, ත්‍රිකුණාමලය සහ කැබිලිත්ත යන රක්ෂිත ප්‍රදේශ, සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් බුන්දල, උඩවලව, ගල්ඔය, යාල සහ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානද තෝරාගෙන ඇත. පාරිසරික සහ සමාජීය ප්‍රමුඛතා මත පදනම්ව ඒකාබද්ධ සැලසුම්කරණය තුලින් රක්ෂිත ප්‍රදේශ තුළ සංවර්ධන වැඩසටහන් පෙළගැසීමට සහ තුලනය කිරීමට අවධානය යොමු කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් සැලසුම්කර ඇති ක්‍රියාකාරකම් කිහිපයක්වේ.

- කළමනාකරණ සැලසුම්වලට සහ සංරක්ෂණ ප්‍රයත්නයන්ට අනුකූලව රක්ෂිත ප්‍රදේශතුළ පිහිටි වාසස්ථානවල (habitats) ගුණාත්මකබව සහ ප්‍රමාණාත්මක බව ඉහළ නැංවීම.

- ස්වභාවික සම්පත් මත පදනම් වූ ඵලදායී තිරසර ජීවනෝපායන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම (livelihood improvement).
- රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ ජීවත්වන ප්‍රජාව මුහුණදෙන අලි-මිනිස් ගැටුම, අලි-මිනිස් සහජීවනයක් (co-existence) බවට පරිවර්තනය කිරීමට මැදිහත්වීම.
- ඉතා සුවිශේෂ වූ පාරිසරික, සංස්කෘතික සහ සමාජ ආර්ථික ලක්ෂණ ඇති ජෛව විවිධත්වය අතින් පොහොසත් තෝරාගත් භූ-දර්ශක දෙකක ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ඒවා අදාල සැලසුම්වලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට සහය දැක්වීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහය දැක්වීම සහ එම ආයතනවල ආයතනික හැකියාව ශක්තිමත් කිරීම.

මෙම කර්තව්‍යන් මුදුන්පත් කරගැනීම සඳහා ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කරනු ලබන ආයතනයන් ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කරන අතර, අනෙකුත් රාජ්‍ය ආයතන, පුද්ගලික අංශයේ ආයතන, සිවිල් සමාජ, රාජ්‍ය නොවන සංවිධාන, සහ ප්‍රජාවගේ දායකත්වය ලබාගැනීම ව්‍යාපෘතියේ අරමුණයි.

2017 සිට 2021 දක්වා යෝජිත මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල වන්නේ (outcomes):

- වන ආවරණය ඉහළ නැංවීම, පවත්නා වනාන්තර සුපෝෂණය කිරීම සහ රක්ෂිත ප්‍රදේශ තුල ඇති ජලාශ වැඩිදියුණු කිරීම තුළින් රක්ෂිත ප්‍රදේශවල ගුණාත්මකබව ඉහළ නැංවීම.
- කෘෂිකාර්මික නිෂ්පාදන සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ජලාධාර සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම.
- පරිසර පද්ධතිවලින් ලැබෙන ප්‍රතිලාභ සහ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම තුළින් ස්වාරක්ෂක කලාපය තුළ වෙසෙන ප්‍රජාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම.
- රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ ජීවත්වන ජනතාව මුහුණදෙන අලි-මිනිස් ගැටුම අවම කිරීමට සහයවීම.
- පාරිසරික සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම තුළින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදායම් උත්පාදනය ඉහළ නැංවීම.
- ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා දායකවන ප්‍රධාන ආයතනවල (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) ආයතනික හැකියාවන් වර්ධනය කිරීම.

ඉහත ප්‍රථිපල මුදුන්පමුණුවා ගැනීම තුලින් නිත්‍ය රක්ෂිත වනාන්තර පද්ධතියක් (permanent protected area network) ගොඩ නැගීම, තිරසාර මට්ටමින් ඉඩම් භාවිතයට ගැනීම, අලි-මිනිස් ගැටුම සමථයකට පත් කිරීම, ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම වැනි කරුණු වලට අමතරව පරිසර පද්ධතිවල ජීවය සුරකින සම්පත්වලින් ලැබෙන ප්‍රතිලාභ වර්තමාන සහ අනාගත පරපුරට අඛණ්ඩව සැපයීමටද හැකිවනු ඇත.

මෙම ව්‍යාපෘතියේ මෙහෙවර ඇගයීමට මෙන්ම, මීට අදාල පාර්ශ්වකරුවන්ට මෙන්ම අපේක්ෂිත ප්‍රතිලාභින්ට මෙහි ඇති වැදගත්කම අවබෝධ කිරීමට සහ ව්‍යාපෘතිය පිළිබඳව කරුණු දැනුවත්කිරීම සඳහා වාර්තාමය වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා ඉහත කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.